# අපේ උරුමයට පණ පොවන පුංචි හපනා
# සුදාර ඩි සිල්වා




අප සමග ජීවත්වන බොහෝ පුංචි දරුවන්ගේ දක්ෂතා අති විශිෂ්ටයි . එවැනි දරුවන් අතරින් තවත් අපූරු හපනෙක් ඔබට හඳුන්වාදෙන්නයි අද මම සැරසෙන්නේ. 2008 රන් කෙවිට චිත්‍රපටයේ රූගත කිරීම් සඳහා ලංකාවට ගිය මට හෝකන්දර මූන් ස්ටාර් ළදරු පාසලෙන් ඔවුන්ගේ විවිධ ප්‍රසංගය නැඹීමට පැමිණෙන ලෙස මට ආරාධනාවක් ලැබුණා. මෙම විවිධ ප්‍රසංගය නරඹන අතරේදී එක් පුංචි හුරු බුහුටි අවුරුදු 4ක් පමණ වන දරුවෙක් අපූරු රංගනයක් ඉදිරිපත් කරමින් වේදිකාවට පැමිණියා. ගමේ කෝපි කඩේ දෙන්න දෙපැත්තේ කියන අපූරු ගීතයට රංගනය කළ පුංචි හපනාට ප්‍රේක්ෂකාගාරයේ සිටි හැමෝම ඔවුන්ගේ උණුසුම් ප්‍රතිචාරය ලබා දුන්නා. ඒ තමයි අද අපේ කතා නායකයා වන පුංචි සුදාර ඩි සිල්වා. ඒ තමයි ඔහුගේ පළමු වේදිකා






ශ්‍රීනාත් මැද්දුමගේ

ප්‍රවිශ්ටය. කෙටි නිවාඩුවකට ලංකාවට ගිය අවස්ථාවේ තමයි ඔහු ඒ රංගනය ඉදිරිපත් කළේ.

එයට වසර කීපයකට පසුව 2011 ඔහුගේ පියා වන රංග ශිල්පි නන්දසිරි සිල්වා ස්කැට්ස් කෙටි නාට්‍ය උළෙල වෙනුවෙන් ඉදිරිපත් කළ එය මම සොයා ගත්තා කෙටි නාට්‍යයේ සුදාර අපූරු රංගනයක් කරනු නිරීක්ෂණය කරන්නටද මම භාග්‍යය ලැබුවා. රංගනය පමණක් නෙවෙයි ගායනය හා නර්තනය සඳහාද උපන් හපන්කම් පෙන්වන සුදාර එදා දැක්වූ දස්කම් ප්‍රසංශනීයයි.

මෙවැනි අපූරු දක්ෂතා ඇති සුදාර ඩි සිල්වා මෙවර අපට ඉදිපත් කරන්නේ තවක් විශිෂ්ට නිර්මාණයක්. ඒ ඔහුගේ හඬින් ගැයූ ජන ගී ඇතුළත් සංගත තැටියක් එළි දැක්වීම. මාර්තු 8 වන දා සවස 6ට ග්ලැඩ්ස්ටන් පාක් කොමියුනිටි සෙන්ටර් හිදී පැවැත්වෙනවා.

ජන ගී යනු අපේ අනන්‍යතාවයි. අපේ යයි කිව හැකි එකම නාද රටාව ඇත්තේ ජන ගීයේය. මේ ජන ගී ආරම්භ වනුයේ ජන කවි ාභාෂයෙනි. ජන කවිය යනු සමාජය නිරූපනය කරන මුද්‍රාවකි. ජන සමාජය නිවැරදිව දර්ශනය කළ හැකි රූප රාමුවකි. අපේ සංස්කෘතික මූලයකි. කෘෂිකර්මාන්තය සමග ඒකාබද්ධව පැවති අපේ ජන ගීය හා ජන කවිය අද වන විට සමාජයෙන් ඉතා ඉක්මණින් ඈත් වෙමින් පවතියි. මෙවැනි යුගයක මේ ආකාරයේ සංගත තැටියක් පුංචි හපනකු අතින් නිර්මාණය වීම එයට පිටුපසින් සිටි සියලු දෙනාටම පැසසුම් ලැබෙන කාර්යයකි.

සන්නස වෙනුවෙන් සුදාර හා කළ සාකච්ඡාවයි මේ.

**පුතා කොහොමද මේ කවි කියන්න ඉගෙන ගත්තෙ?**

පොඩි කාලෙ ඉඳන් අපේ තාත්තා මේ කවි ගෙදර ගායනා කරනවා. අයියටයි අක්කටයි මටයි කියලා දෙනවා. තාත්තා කියනකොට අපිත් කියනවා.. එහෙම කියනකොට නිකම්ම පුරුදු වුණා. අපේ අම්මත් කවි පොත් ගෙනල්ලා ඒ කවි අපට පාඩම් කරවනවා.

**මේ සංගත තැටිය කරන්න පෙළඹුනේ කොහොමද?**

2012 ලෝක ළමා දිනය වෙනුවෙන් මිහිඳු ළමා සමාජයේ විනීතා විජේරත්න නැන්දා මෙහෙයවූ ජන ගායනා තරගයෙන් මම පළමු ස්ථානය දිනා ගත්තා. ඊට පස්සෙ අම්මගෙයි තාත්තාගෙයි උනන්දුව මත තමයි මේ සංගත තැටිය කළේ.

**කවුද මේ ගායනා පුරුදු පුහුණු කළේ?**

මේ ගායනා මට පුහුණු කළේ විශාරද ඉන්ද්‍රානි විජයලතා කුලතුංග මහත්මියයි.

**සුදාර නර්තනය පිළිබඳව යම් හැදෑරීමක් කරනවද?**

ඔව්. මම මුලින්ම ගුරුහරුකම් ලැබුවෙ අපේ තාත්තාගෙන්. ඉන් පස්සෙ රංගන උදුම්බරා නැන්දාගෙන් හා ඉමාමා ගෙන්. දැන් චලංක අතලගේ සර්ගෙන් නර්තනය ඉගෙන ගන්නවා. එයට අමතරව චිල්ඩ්‍රන් පර්ෆෝර්මිං කම්පැනි ඔෆ් ඕසේට්‍රිලියා එකෙනුත් මම ඩ්‍රාමා ඇන්ඩ් තියටර් ඉගෙන ගනිමින් ඉන්නවා.

**පුතා ඉගෙන ගන්න පාසල මොකක්ද?**

මම ඉගෙන ගන්නෙ ග්ලැඩ්ස්ටන් විව් පාසලේ 4 වන වසරේ. ඒ එක්කම සිංහල භාෂා පාසලෙන් සිංහල භාෂාව ඉගෙන ගන්නවා.

**ලැබුණ ජයග්‍රහණ ගැන කිව්වොත්**

මේ අවුරුද්දෙ ඉස්කෝලෙ තිබුණ ටැලන්ට් ෂෝ එකේදි උඩරට නැටුමක් ඉදිරිපත් කරලා මම පළමුවැනි ස්ථානය දිනා ගත්තා. ඒ අරෙන්නට අවුරුදු උත්සව වල විකට ඇඳුම් තරග රැසකිනුත් මම ජය අරගෙන තියෙනවා. ගිම්හාන රංගන ප්‍රසංගයටත් මම සහභාගි වෙලා තියෙනවා.

**පවුලේ අනෙක් අය කව්ද?**

මගේ අයියා උදාර. අක්කා උදාරි. අපි තුන්දෙනත් එකතුවෙලා ගොඩක් රංගන ඉදිරිපත් කරලා තියෙනවා. ඒ හැම එකක්ම කරන්නට අප උනන්දු කරන්නෙ අපේ තාත්තයි අම්මයි.

සුදාරගේ ජන ගායනා සංගත තැටිය 2013 සැප්තැම්බර් මාසයේ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වුණ පොත් ප්‍රදර්ශනයට සමගාමීව එළි දැක්වුණේ කලාශූරි සතිස්චන්ද්‍ර එදිරිසිංහ කැළණිය සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ අංශ ප්‍රධානී සමන් පනාපිටිය සහ සරත් සන්දනායක යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙනි. මාර්තු 8 වන දින සවස 6ට මේ දක්ෂ දරුවාගේ නිර්මාණ එකතුව එළි දැක්වෙන උළෙලට අප සැම සහභාගි විය යුත්තේ ඔහු අපේ නෙකුත් දරු දැරියනටත් ආදර්ශයක් හා ධෛර්යයක් දෙන බැවිනි.

**සුදාර ඩි සිල්වාගේ "සුමියුරු සිහල ජන ගී" සංගත තැටිය එළි දැක්වීම**
**මාර්තු 8 වන දා සවස 6ට**
**ග්ලැඩ්ස්ටන් පාක් කොමියුනිටි සෙන්ටර් හිදී**

## පුංචි අපි Kids Corner




විහඟි ජයසිංහ
2 ශ්‍රේණිය රොක්ස්බර්ග්පාක් සිංහල භාෂා පාසල




සිනෙලි රූපසිංහ
2 ශ්‍රේණිය රොක්ස්බර්ග්පාක් සිංහල භාෂා පාසල




තරණි දිසානායක
2 ශ්‍රේණිය රොක්ස්බර්ග්පාක් සිංහල භාෂා පාසල